# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,452- 2006 ජුනි 30 වැනි සිකුරාදා - 2006.06.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 506 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 507 |
| මිල පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | 509 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 512 |
| නාවියන්ට දැන්වීම් - - | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජුනි මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 136

D/RF/824/NY/04.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2006 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික කොමදෝරු වශයෙන් :

කපිතාන් (ටැස්) රවීන්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණරත්න, ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්එන්, ශ්‍රීලංනාහ ;
කපිතාන් (මාලිමා) ධම්මික ශිරන්ත උඩවත්ත, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

06-803

---

D/22/NY/372.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

නාවික හමුදා සේවය සඳහා වෛද්‍ය හේතූන් මත නුසුදුසු වීම නිසා 2006 මාර්තු මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායෙන් පහත නම සඳහන් නිළධාරියා අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

වැඩබලන උප ලුතිනන් (ඉ) වල්ගම රණසිංහ ආරච්චිගේ සුරංග ප්‍රියදර්ශණ, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-802

2006 අංක 137

D/RF/826/NY.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

2005 ජූලි මස 01 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (වෛද්‍ය) වශයෙන් :

01. මධ්‍ය නිළධාරී හිමාලි කාංචනා ධර්මවීර, ශ්‍රීලංනාහ.

2004 ඔක්තෝබර් මස 23 දින සිට වැඩබලන උප ලුතිනන් (විදුලි) වශයෙන්:

02. මධ්‍ය නිළධාරී නුවන් රංගනාත් කරුණාරත්න, ශ්‍රීලංනාහ ;
03. මධ්‍ය නිළධාරී බ්‍රැන්ඩි වත්තගේ ඉෂාර චින්තක පෙරේරා, ශ්‍රීලංනාහ ;
04. මධ්‍ය නිළධාරී මලවර කංකානමලාගේ කාවින්ද චරිත් ප්‍රේමරත්න, ශ්‍රීලංනාහ.

2004 ඔක්තෝබර් මස 23 දින සිට වැඩබලන උප ලුතිනන් (ඉංජිනේරු) වශයෙන් :

05. මධ්‍ය නිළධාරී දසනායක මුදියන්සේලාගේ ප්‍රසාද් මිලින්ද දසනායක, ශ්‍රීලංනාහ ;
06. මධ්‍ය නිළධාරී විජේවර්ධන පටබැන්දලාගේ ප්‍රදීප් කුමාර විජේරත්න, ශ්‍රීලංනාහ ;
07. මධ්‍ය නිළධාරී මුනගමගේ *නොහොත්* හෙට්ටිගේ බිහාර දිනේෂ්, ශ්‍රීලංනාහ ;
08. මධ්‍ය නිළධාරී බතල වත්තගේ මංජුල ප්‍රභාත් විමලරත්න, ශ්‍රීලංනාහ.

2004 ජූලි මස 12 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (නාවික සෙබල) වශයෙන් :

09. මධ්‍ය නිළධාරී මඩවල වික්‍රමසිංහ සෙනෙවිරත්න රාජකරුණා ඒකනායක මුදියන්සේ රාලහාමිලාගේ අනුද් කාවිංග කුමාර මඩවල, ශ්‍රීලංනාහ.

2004 ජූනි මස 12 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (විධායක) වශයෙන් :

10. මධ්‍ය නිළධාරී චමින්ද රංගලාල් ප්‍රියදර්ශණ වළාකුළුගේ, ශ්‍රීලංනාහ ;
11. මධ්‍ය නිළධාරී ජයමහ හිටිහාමිලාගේ චමීර හිරාන් රණවීර, ශ්‍රීලංනාහ ;
12. මධ්‍ය නිළධාරී ගෝදාව පතිරණගේ ඉන්දික එරංග, ශ්‍රීලංනාහ ;
13. මධ්‍ය නිළධාරී යමන් සපුගේ චන්ද්‍ර සුජිත් කුමාර, ශ්‍රීලංනාහ ;
14. මධ්‍ය නිළධාරී සේනාරත්න මුදලිගේ නිලූක කාංචන ගුණරත්න බණ්ඩාර, ශ්‍රීලංනාහ ;
15. මධ්‍ය නිළධාරී සිල්මන් ආරච්චිලාගේ චමින්ද රොෂාන් කුලතුංග, ශ්‍රීලංනාහ ;
16. මධ්‍ය නිළධාරී අතුකෝරළගේ දොන් රංගන විජයනන්දන අතුකෝරල, ශ්‍රීලංනාහ ;
17. මධ්‍ය නිළධාරී කැලැකෝරලේ ගෙදර සමන්සිරි රාජපක්ෂ, ශ්‍රීලංනාහ ;
18. මධ්‍ය නිළධාරී අමිල රුක්මල් එදිරිසිංහ, ශ්‍රීලංනාහ ;
19. මධ්‍ය නිළධාරී සිංහ පෑලිච් අත්තනායක මුදියන්සේලාගේ ගයාන් බුද්ධික අත්තනායක, ශ්‍රීලංනාහ ;
20. මධ්‍ය නිළධාරී කසුන් අනුරාධ නුවරපක්ෂ, ශ්‍රීලංනාහ.

2004 ජුනි මස 12 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (නාවික සෙබල) වශයෙන් :

21. මධ්‍ය නිලධාරී රාජපක්ෂ ආරච්චිල්ලාගේ සංජීව කපිල රාජපක්ෂ, ශ්‍රීලංනාහ ;
22. මධ්‍ය නිලධාරී විතානගේ සමිත් කුමාර, ශ්‍රීලංනාහ ;
23. මධ්‍ය නිලධාරී උණ්ඩියේ ගෙදර මුදලිනායක සුමනවීර, ශ්‍රීලංනාහ ;
24. මධ්‍ය නිලධාරී දිනේෂ් සාගර ලොකුගේ, ශ්‍රීලංනාහ ;
25. මධ්‍ය නිලධාරී නෙත්තසිංහ අප්පුහාමිලාගේ චමින්ද ප්‍රදීප් කුමාර රණතුංග, ශ්‍රීලංනාහ ;
26. මධ්‍ය නිලධාරී පතිරාජ කාරියවසම්ගේ ඔෂාන් හිමන්සු කුමාර, ශ්‍රීලංනාහ ;
27. මධ්‍ය නිලධාරී නානායක්කාරවසම් සෙම්බකුට්ටිගේ රොෂාන් නානායක්කාර, ශ්‍රීලංනාහ ;
28. මධ්‍ය නිලධාරී බස්නායක මුදියන්සේලාගේ සුමිත් සුජීව ගුණරත්න, ශ්‍රීලංනාහ ;
29. මධ්‍ය නිලධාරී දෙනියේ ගෙදර කමල් ශ්‍රේෂන් තිස්ස කුමාර, ශ්‍රීලංනාහ ;
30. මධ්‍ය නිලධාරී අමරසිංහ ආරච්චිලාගේ තරංග රන්දික, ශ්‍රීලංනාහ ;
31. මධ්‍ය නිලධාරී හර්ෂ මධුශංඛ උඩවත්ත, ශ්‍රීලංනාහ ;
32. මධ්‍ය නිලධාරී දොන් චරිත් සතීර කළුතන්ත්‍රි, ශ්‍රීලංනාහ ;
33. මධ්‍ය නිලළධාරී ඉලන්දරගේ උදය ජයශාන්ත, ශ්‍රීලංනාහ ;
34. මධ්‍ය නිලධාරී තොටගේ අමල් පියසේන, ශ්‍රීලංනාහ ;
35. මධ්‍ය නිලධාරී පවිත්‍ර චාමර ප්‍රසාංගන අභංගම ලියනගේ, ශ්‍රීලංනාහ ;
36. මධ්‍ය නිලධාරී අමරසිංහ ආරච්චිගේ දූලන ආරියදාස, ශ්‍රීලංනාහ.

2004 ජුනි මස 12 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (සැපයුම්) වශයෙන් :

37. මධ්‍ය නිලධාරී චරිත් ශාස්ත්‍රි උබේසේකර, ශ්‍රීලංනාහ ;
38. මධ්‍ය නිලධාරී කොඩිමරක්කලගේ ලසන්ත රොෂාන් ප්‍රනාන්දු, ශ්‍රීලංනාහ ;
39. මධ්‍ය නිලධාරී වික්‍රමආරච්චිලාගේ නලීන් තරංග ලක්මාලි වික්‍රමආරච්චි, ශ්‍රීලංනාහ ;
40. මධ්‍ය නිලධාරී හරිගම්පිටියගේ ඩිලාන් සාරංග ජයතිලක, ශ්‍රීලංනාහ ;
41. මධ්‍ය නිලධාරී ටිවන්ත ප්‍රසංග හපුආරච්චි, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ.

06-804

# ආණ්ඩුවේ නිවේදන

## වන්නිවිලාංකුලම ශ්‍රී මුත්තුමාරි අම්මන් කෝවිල්

පොංකල් උත්සවය - 2006

ඉහත සඳහන් පොංකල් උත්සවය 2006 ජුනි මස 09 වැනි දින පෙරවරු 6.00ට පටන් ගෙන 2006 ජුනි මස 10 වැනි දින පෙරවරු 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2006 ජුනි මස 01 වැනි දින.

06-739

## ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්දෝන්රි ඊස්වර් කෝවිල් උත්සවය - 2006

ඉහත සඳහන් උත්සවය 2006 ජුනි මස 25 වැනි දින පෙරවරු 6.00ට පටන් ගෙන 2006 ජූලි මස 10 වැනි දින ප. ව. 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2006 ජුනි මස 01 වැනි දින.

06-740

## 2006/2007 වර්ෂ සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්, භාණ්ඩ සහ සේවාවන් සපයන්නන් හා වාහන අළුත්වැඩියා කරන්නන් ලියාපදිංචි කිරීම

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ සියළුම ආයතනයන් සඳහා පහත දැක්වෙන උපලේඛනවලට අදාලව පුද්ගලයන් හා ආයතන ලියාපදිංචි කරනු ලැබේ. ඒ අනුව සුදුසුකම්ලත් පුද්ගලයින් හා ආයතන විසින් පහත සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලියාපදිංචි විය හැකිය.

උපලේඛනය

| | | *ලියාපදිංචි ගාස්තුව රු.* |
|---|---|---|
| (i) | කාර්යාල උපකරණ, ලිපිද්‍රව්‍ය හා වානේ භාණ්ඩ සැපයීම | 250 |

| | | *ලියාපදිංචි ගාස්තුව* *රු.* |
|---|---|---|
| (ii) | ලිපිද්‍රව්‍ය හා විදුලි උපකරණ | 150 |
| (iii) | පරිගණක, ඡායා පිටපත්, රෝනියෝ යන්ත්‍ර සැපයීම | 500 |
| (iv) | ගොඩනැගිලි ඉදිකිරීම් | 1,000 |
| (v) | පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර හා රෝනියෝ යන්ත්‍ර සේවා කිරීම | 500 |
| (vi) | මුද්‍රණ කටයුතු | 100 |
| (vii) | වාහන අළුත්වැඩියා කිරීම | 500 |

02. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය ජූලි මස 31 දින වන අතර, එදිනට පෙර මුදල් භාරදී විටිමත් කුවිතාන්සියක් ලබාගත යුතුය. පසුව ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

03. එම කුවිතාන්සිය සමඟ මවිසින් පිළියෙල කරන ලද ඉල්ලුම්පතක් ලබාගෙන සම්පූර්ණ කර 2006.07.31 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එච්. එම්. හේරත්,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් සහ
අතිරේක ලේකම්-ස්වදේශ කටයුතු.

2006 ජුනි මස,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06-741

---

## පෙරියකට්ටු ශාන්ත අන්තෝනි දෙව්මැඳුරේ උත්සවය - 2006

ඉහත සඳහන් උත්සවය 2006 ජූලි මස 28 වැනි දින ආරම්භ කර 2006 අගෝස්තු මස 06 වැනි දින අවසන් කරන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන *ගැසට් පත්‍රවල* පළවූ නිවේදනවලට පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

එස්. ෂන්මුගම්,
දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
වවුනියාව.

2006 ජුනි මස 08 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය.

06-806

---

## රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2006

(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥා පනත

ඉහත සඳහන් උත්සවය 2006 ජූලි මස 26 වැනි දිනෙන් ආරම්භ වී 2006 අගෝස්තු මස 10 වැනි දින නිමාවට පත්වන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥා පනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි :

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9,859 දරන *ගැසට් පත්‍රය* ;
1949 ජූලි මස 22 දාතම හා අංක 10,000 දරන *ගැසට් පත්‍රය* ;
1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11,255 දරන *ගැසට් පත්‍රය* ;
1961 ජූලි මස 07 දාතම හා අංක 12,508 දරන *ගැසට් පත්‍රය* ;
1962 මාර්තු මස 02 දාතම හා අංක 12,947 දරන *ගැසට් පත්‍රය.*

පී. බී. අමරසේකර,
දිස්ත්‍රික් ලේකම්,
මොණරාගල.

2006 ජුනි මස 05 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

## රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2006

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859, 1949 ජූලි මස 22 දාතම හා අංක 10,000, 1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255, 1961 ජූලි මස 07 දාතම හා අංක 12508, 1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රවල පළවූ කතරගම වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

කඳවුරු ප්‍රදේශය යනු :

*(අ)* කතරගම මැණික් ගඟේ පැරණි තොටුපලේ සිට සැතපුම් 01ක අර්ධ විෂ්කම්භයකින් වට වූ ප්‍රදේශය,
හා
(ආ) සෙල්ල කතරගම පුල්ලෙයාර් කෝවිලේ සිට සැතපුම් කාලක අර්ධ විෂ්කම්භයකින් වටවූ ප්‍රදේශය.

01. *ගොඩනැගිලි ඉදි කිරීම :*

මගෙන් හෝ බලයලත් නිළධාරියෙකුගෙන් ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් 2006 ජූලි මස 26 වැනි දින සිට 2006 අගෝස්තු මස 10 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳ සැලක් ඉදි නොකළ යුතුය.

02. *යාචකයෝ :*

කතරගම මැණික් ගඟේ 2 වන පාලම අසල තනා ඇති යාචක මඩුව තුළ හෝ ඒ මඩුවේ සිට යාර 5ක් ඇතුළත මිස පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනකදී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීමද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදාදීම ද නොකළ යුතුය.

03. *නෑම සහ සේදීම :*

මැණික් ගඟේ කතරගම ජල සම්පාදන ක්‍රමය සඳහා ජලය ලබා ගන්නා ස්ථානයට සහ ඊට ඉහලින් සැතපුම් 03ක ප්‍රදේශය තුළ මැණික් ගඟේ කිසිවකු දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම නොකළ යුතුය.

04. *වාහන :*

4.1 මගෙන් හෝ බලයලත් නිළධාරියෙකුගෙන් ලබාගත් අවසරයක් රහිතව කිසිවෙකු විසින් මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට

(මැණික් ගඟෙන් නැගෙනහිර පෙදෙසට) පැදවීම හෝ ඇතුල් කිරීම නොකළ යුතුය.

4.2 කඳවුරකට අයත් නව නගරයේ වාහන නතර කිරීමට වෙන්කර ඇති රිය ගාල්වල හැර කිසිදු වාහනයක් වෙනත් තැනක නතරකර නොතැබිය යුතුය.

05. *කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානය :*

කඳවුරු පෙදෙස මවිසින් අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක් පිහිටුවනු නොලැබිය යුතුය.

06. *කාවාඩි කඩ :*

මගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටුවනු නොලැබිය යුතුය.

07. *වෙළඳාම :*

7.1 පූජා පෙදෙස, චන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලා ප්‍රදේශය, නැවතුම්පොල, අංක 1 සහ 2 මගී පාලම්වල මාර්ගය යන ස්ථානවල සංචාරක වෙළඳාම තහනම්ය.

7.2 මවිසින් ඒ සඳහා අවසර දුන් ස්ථාන හැර කිසිවෙකු විසින් තිත්තෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතුය.

7.3 කිරිවෙහෙරට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට තනා ඇති මල් අලෙවි සැල්වල මල් අලෙවි කිරීම හැර කිසිවෙකු විසින් පූජා නගරය තුළ කඩයක් තැනීම, පවත්වාගෙනයාම, කිසිවක් වෙළඳාම් කිරීම නොකළ යුතුය.

7.4 සෑම ගොඩනැගිල්ලක්ම හා සෑම වෙළඳ සැලකම කසළ බඳුනක් තිබිය යුතු අතර, එම ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතුය.

7.5 විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතුය.

පී. බී. අමරසේකර,<br>
දිස්ත්‍රික් ලේකම්,<br>
මොණරාගල.

2006 ජුනි මස 05 වැනි දින,<br>
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06-738

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## සේවක අධ්‍යාපන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

### 2005 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

| *වත්කම්* | *2004* | | *2005* | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 1,756,250 | | 1,417,737 | |
| (ආ) ලී බඩු සහ කාර්යාල උපකරණ | 2,637,684 | | 2,915,675 | |
| (ඇ) පුස්තකාල පොත් සහ වාර සඟරා | 424,059 | | 553,552 | |
| (ඈ) මෝටර් රථ | 363,343 | | 67,070 | |
| (ඉ) පුනරුත්ථාපන හා නඩත්තු (ගොඩනැගිලි) | 477,399 | 5,658,735 | 441,177 | 5,395,211 |
| ආයෝජන | | 7,488,780 | | 7,511,466 |
| **ජංගම වත්කම්** | | | | |
| (අ) තොග | 176,781 | | 377,033 | |
| (ආ) සේවක ණය හා අත්තිකාරම් | 2,903,151 | | 3,123,881 | |
| (ඇ) විවිධ අත්තිකාරම් | 240,928 | | 224,838 | |
| (ඈ) පූර්ව ගෙවීම් | 45,149 | | 43,789 | |
| (ඉ) වැඩිපුර ගෙවීම් | 57,531 | | 41,886 | |
| (ඊ) වෙනත් | 229,259 | | 282,880 | |
| (උ) මුදල් හා මුදල් සමාන දේ | 1,841,546 | 5,494,345 | 1,656,195 | 5,750,502 |
| වත්කම්වල එකතුව | | 18,641,860 | | 18,657,179 |
| **ස්කන්ධ සහ බැරකම් - ප්‍රාග්ධනය** | | | | |
| (අ) වැය කළ ප්‍රාග්ධනය | 16,174,848 | | 17,038,538 | |
| (ආ) වැය නොකළ ප්‍රාග්ධනය | 130,495 | | 406,806 | |

| වත්කම් | 2004 | | 2005 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| (ඇ) ත්‍යාග හා පරිත්‍යාග | 327,835 | | 349,465 | |
| (ඈ) ප්‍රාග්ධනයට දායකත්වය : | | | | |
| (i) ආයතනය ආදායමින් හා පොදු සංචිතයෙන් | 160,373 | | 160,373 | |
| (ii) කෙටිකාලීන පාඨමාලා ආදායමින් | 3,459,017 | | 3,741,317 | |
| (iii) සේ. අ. ආයතන සංවර්ධන අරමුදලින් | 479,551 | | 479,551 | |
| (iv) තොරතුරු තාක්ෂණ අරමුදල | 500,000 | 21,232,119 | 500,000 | 22,676,050 |
| **සමුච්චිත අරමුදල** | | | | |
| පොදු සංචිතය | (13,282,261) | | (17,669,419) | |
| ආදායම් වියදම් ගිණුම | (3,772,949) | (17,055,210) | (3,844,514) | (21,513,933) |
| | | **4,176,909** | | **(1,162,117)** |
| **සංචිත සහ නිශ්චිත අරමුදල** | | | | |
| (අ) ත්‍යාග මුදල් දීමේ අරමුදල | 46,000 | | 46,000 | |
| (ආ) උරුමක්කාර අරමුදල | 9,000 | | 9,000 | |
| (ඇ) සේවක අධ්‍යාපන සංවර්ධන අරමුදල් | 741,992 | | 753,642 | |
| (ඈ) ගොඩනැගිලි අරමුදල | 1,502,125 | | 1,502,125 | |
| (ඉ) වෙනත්-ස්වයං මූල්‍ය පාඨමාලා | 7,620,746 | 9,919,863 | 8,075,051 | 10,385,818 |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 3,566,027 | | 4,985,308 |
| **ජංගම බැරකම්** | | | | |
| (අ) ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 76,366 | | 1,182,042 | |
| (ආ) උපචිත වියදම් | 121,970 | | 216,832 | |
| (ඇ) ගෙවිය යුතු තැන්පතු | 540,348 | | 626,878 | |
| (ඈ) අගරු වූ චෙක්පත් ගිණුම | 4,770 | | 19,380 | |
| (ඉ) විගණන ගාස්තු ප්‍රතිපාදන | 60,000 | | 65,000 | |
| (ඊ) විවිධ ණය හිමියෝ | 175,486 | | - | |
| (උ) වෙනත් | 121 | 979,061 | 13,804 | 2,123,936 |
| මුළු බැරකම් | | 22,818,769 | | 18,657,179 |

නිවැරදි බව සහතික කරමු.

ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම,
අධ්‍යක්ෂ.

එන්. විජයවර්ධන,
නියෝජ්‍ය මූල්‍යාධිකාරී.

*සටහන* :

1. ක්ෂය කරනු ලබන වත්කම් සඳහා ලෙජර් ගිණුම් ශේෂ මත ක්ෂය කිරීම් සහ ක්ෂය ප්‍රතිපාදන කිරීම් කරනු ලැබ ඇත.
2. මෙම ගිණුම් පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කරමින් ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇත.
3. ගිණුමෙහි තොගවල භෞතික ශේෂයන් දක්වා ඇත.

## කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

**2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම**
**(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත)**

| ආදායම් | 2004 | | 2005 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 01. රජයේ ආධාර | | | | |
| (අ) රජයේ ආධාර (පුනරාවර්තන) | 5,720,000 | | 11,800,000 | |
| (ආ) රජයේ අධාර වත්කම් ප්‍රතිසංස්කරණ හා නඩත්තු | 18,000 | | - | |
| (ඇ) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර | 435,000 | | 373,100 | |

| *ආදායම්* | *2004* | | *2005* | |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| (ඇ) හිඟ වැටුප් ගෙවීම සඳහා වි. වි. ප. කො. සභාවෙන් ආධාර | 2,100,000 | 8,273,000 | - | 12,173,100 |
| (ඉ) සේවක අධ්‍යාපන සංවර්ධන අරමුදලින් ලබාගත් අරමුදල් | 210,167 | | | |
| 02. ලියාපදිංචි ගාස්තු ප්‍රථම උපාධි | 112,250 | | 300,500 | |
| 03. ශිෂ්‍ය ගාස්තු | 508,600 | | - | |
| 04. පරිගණක පාඨමාලා ගාස්තු | - | | 27,300 | |
| 05. විභාග ගාස්තු | 16,675 | | 37,555 | |
| 06. ණය පොළී | 123,049 | | 114,541 | |
| 07. ආයෝජන පොළී | 213,965 | | 212,621 | |
| 08. පරණ භාණ්ඩ විකිණීම | 5,278 | | 1,476 | |
| 09. ප්‍රකාශන විකිණීම | - | | 1,150 | |
| 10. පුස්තකාල දඩ | 2,048 | | 4,982 | |
| 11. ව්‍යාපාරික කටයුතුවලින් | 147,394 | | 14,472 | |
| 12. සුළු මිශ්‍ර ආදායම් | 269,417 | | 192,197 | |
| 13. ටෙන්ඩර් ගාස්තු | 1,500 | | - | |
| 14. ගර්හිත භාණ්ඩ අපහරණ ලාභය | 7,748 | | 1,133 | |
| 15. අතුරු දීමනා ලැබීම් ගිණුම | 320,000 | | - | |
| 16. පොදු චක්‍රලේඛ 850 ලැබීම් ගිණුම | 56,000 | | - | |
| 17. උපාධි ලෝගු කුලිය | - | | 66,850 | |
| 18. කෙටිකාලීන පාඨමාලා ලැබීම් ගිණුම | - | 1,994,091 | 11,205,187 | 12,179,964 |
| ශේෂය ඉ/ගෙ | | **10,267,091** | | **24,353,064** |
| **වියදම** | | | | |
| 01. පෞද්ගලික පඩිනඩි | | | | |
| වැටුප් හා වේතන | 5,187,243 | | 6,072,051 | |
| වි. අ. අ./සේ. භා. අ./විශ්‍රාම වැටුප් | 985,947 | | 1,148,656 | |
| දීමනා | 2,055,127 | | 2,948,128 | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | 356,954 | | 594,836 | |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 897,350 | | 941,793 | |
| 02. ගමන් වියදම් | 5,200 | | 28,882 | |
| 03. සැපයීම් | 564,105 | | 699,190 | |
| 04. නඩත්තු | 257,706 | | 329,147 | |
| 05. කොන්ත්‍රාත්තුමය සේවා | 883,332 | | 1,280,866 | |
| 06. පර්යේෂණ | 17,650 | | - | |
| 07. වෙනත් | 386,883 | | 690,787 | |
| 08. මහපොළ ශිෂ්‍යත්ව | 435,000 | | 373,100 | |
| 09. ක්ෂය කිරීම් | 1,319,019 | | 1,484,218 | |
| 10. පාරිතෝෂික දීමනා | 688,524 | | 1,419,281 | |
| 11. පාඨමාලා වියදම | - | | 10,016,972 | |
| 12. යෝජිත ගාස්තු අය කරන පාඨමාලා සඳහා අත්තිකාරම් | - | 14,040,040 | 169,672 | 28,197,579 |
| ආදායමට වැඩි වියදම | | (3,772,949) | | (3,844,515) |
| ආදායම් සහ වියදම් විසර්ජන ගිණුම | | | | |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය ඉදිරියට ගෙනාවා | | (3,772,949) | | (3,844,515) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | | (13,946,548) | | (17,055,210) |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | 664,287 | | (614,208) |
| ශේෂය ශේෂ පත්‍රයට ගෙන ගියා | | (17,055,210) | | (21,513,933) |

**විගණන මතය**

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත සේවක අධ්‍යාපන ආයතනයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවන ලද 1979 අංක 11 දරන සේවක අධ්‍යාපන ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108 (1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් ඇතිවන බලපෑම් හැර, පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන් වල (සටහන් අංක 1 සිට 3 දක්වා) ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2005 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

විගණනයේදී උද්ගත වූ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත සේවක අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂවරයා අමතන ලද සම දින දරන මාගේ වාර්තාවේ ඇතුලත්ව ඇත.

එස්. සී. මායාදුන්නේ,
විගණකාධිපති.

2006 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ 07,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

06-801

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 15900003141.

ණය ගිණුම් අංකය : 1151415.

2005 මැයි මස 31 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එන්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දාවූ ද 2001 සැප්තැම්බර් මස 10 වැනි දින හා අංක 1753 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලක්ෂපති මහවිදානලාගේ ප්‍රින්ස් ලොයිඩ් ඇන්ටොස් ද මෙල් හෙවත් ලක්ෂපති මහවිදනාලාගේ ප්‍රින්ස් ලොයිඩ් ඇන්ටොස් ද මෙල් සහ ලිහිණියා කුමාරගේ සරෝජා පුෂ්පකුමාරි ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ පනස් දහස් හැට හතයි ශත අනූ තුනක (රු. 7,50,067.93) මුදලක් 2005 පෙබරවාරි මස 28 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් හත්ලක්ෂ පනස් දහස් හැට හතයි ශත අනූ තුනක (රු. 7,50,067.93) මුදලට 2005 මාර්තු මස 1 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,90,000ක මුදල මත 14% වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලක් අඩුකොට එකී අංක 1753 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

01. බලයලත් මානක ඩබ්. ජේ. එම්. පී. එල්. ඩී. සිල්වා විසින් 2000 ඔක්තෝබර් මස 06 වැනි දින සාදන ලද අංක 1107 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තු සල්පිටි කෝරළේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ ඉදිබැද්ද පිහිටි කටුගස්තුඩුවෙවත්ත, ගොරකගහලන්ද සහ ගොරකගහවත්ත ඉඩමේ පිහිටි සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී3 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 1107 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් බී2 සහ බී1 ද, නැගෙනහිරට : ගාමිණී සේනාධීරගේ ඉඩම ද, දකුණට : අංක 1107 දරන පිඹුරේ ලොට් බී6, බී5 සහ බී4 ද, බස්නාහිරට : අංක 1107 දරන පිඹුරේ ලොට් බී2 ද, යන මායිම් තුළ පර්චස් හයයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.75) හෝ හෙක්. 0.01707 විශාල ඉඩම් කොටස අංක 1107 දරන පිඹුර පරිදි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2510/29 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

පහත සඳහන් ගමන් මාර්ග අයිතිය ද සමඟ වේ.

එකී ඉදිබැද්ද පිහිටි කටුගස්තුඩුවෙවත්ත, ගොරකගහලන්ද සහ ගොරකගහවත්ත ඉඩමේ අංක 1107 දරන පිඹුරේ පෙන්වා ඇති බෙදා වෙන් කරන ලද ලොට් බී2 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 1107 දරන පිඹුරේ ලොට් බී1 ද, නැගෙනහිරට : අංක 1107 දරන පිඹුරේ ලොට් බී1, බී3 සහ බී4 ද, දකුණට : අංක 1107 දරන පිඹුරේ ලොට් බී3 සහ ඉහල ඉදිබැද්ද පාර ද සහ බස්නාහිරට : එම්. ආර්. එම්. ප්‍රනාන්දුගේ ඉඩම ද සහ අංක 1107 දරන පිඹුරේ ලොට් බී1 යන මායිම් තුළ පර්චස් හයයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 6.30) හෝ හෙක්. 0.01593 විශාල ඉඩම් කොටස ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2510/28 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

02. බලයලත් මානක එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් 1999 දෙසැම්බර් මස 30 වැනි දින සාදන ලද අංක 59/99 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තු අළුත්කුරු කෝරළේ, දොඹවල ග්‍රාමයේ පිහිටි කෝන්ගහවත්ත ඉඩමේ පිහිටි සියළුදේත් සමඟ බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : පාර ද, නැගෙනහිරට : එස්. ඩබ්. රත්නායකගේ ඉඩම ද, දකුණට : ලොට් 2හි ඉතිරි කොටසට ද සහ බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) හෝ හෙ. 0.0328 විශාල ඉඩම් කොටස.

ඉහත අංක 2හි විස්තර කරන ලද ඉඩම පහත සඳහන් ඉඩමේ නැවත බෙදීමකි.

බලයලත් මානක එස්. රාසප්පා විසින් 1991 පෙබරවාරි මස 11 වැනි දින සාදන ලද අංක 2900 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තු අළුත්කුරු කෝරළේ. දොඹවල ග්‍රාමයේ පිහිටි

කෝන්ගහවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් "ඒ" දරන කොටසට මායිම් උතුරට : කරත්ත පාර ද, නැගෙනහිරට : එස්. ඩබ්. රත්නායකගේ ඉඩම ද, දකුණට සහ බස්නාහිරට : ලොට් 2හි ඉතිරි කොටස ද, යන මායිම් තුළ අංක 2900 දරන පිඹුර පරිදි පර්චස් විසිහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 27.5) හෝ හෙ. 0.0698 විශාල ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 236/44 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-800

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-හොරණ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ෂ 2006 මැයි මස 04 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හොරණ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කන්නන්ගර විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2001.03.19 වැනි දින සහ අංක 1358 දරන බැඳුම්කරය ද, පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව් පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2002.05.09 වැනි දින සහ අංක 92 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කන්කානිගේ සිසිර කුමාර අල්විස් සහ ගල්කන්ද ආරච්චිගේ සභිරා නිරෝෂනී පෙරේරා ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පන්ලක්ෂ තිස්දෙදහස් පන්සිය අසූතුනයි ශත තිස් තුන (රු. 5,32,583.33)ක මුදලක් 2005.09.30 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව ඇති ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 5,32,583.33)ක මුදලට 2005.10.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1358 සහ 92 දරන උකස් බැඳුම්කරයන් මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රයන් කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාරු ආර්. එස්. මහනාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශී සභාවේ, කනන්විල උප කාර්යාලීය සීමාව තුළ, කනන්විල පිහිටි "තොර්පේ එස්ටේට්" නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක ඩී. ඒ. ධර්මසිරි විසින් මැන සාදන ලද 1995.06.20 දිනැති අංක 328 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 9 ලෙස නිරූපිත ඉඩම් කොටස උතුරට : අංක 47 දරන පිඹුර ප්‍රකාරව ලොට් බී7 සහ ලොට් 8න් ද, නැගෙනහිරට : ලොට් 8න් ද, දකුණට : ලොට් 13, 10 සහ 12න් ද, බස්නාහිරට : ලොට් 10 සහ 12න් ද මායිම් වූ එකී පර්චස් දහසයක (අ. 0. රූ. 0, පර්. 16) විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සියළු දේත් සමඟ මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 159/101 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා විසින් සහතික කරන ලද 2002.05.09 දින දරන අංක 92 දරන බැඳුම්කරය ප්‍රකාරව 2වන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති),
මණ්ඩලයේ ලේකම්.

06-816/2

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-රත්නපුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ෂ 2006 මැයි මස 25 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වාලුපිල්ලේ විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද1990ක් වූ සැප්තැම්බර් මස 5, 1993ක් වූ සැප්තැම්බර් මස 20 සහ 1994ක් වූ ඔක්තෝබර් මස 17 වන දිනයන්හි සහ පිළිවෙලින් 3410, 3664 සහ 3734 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කහවලගේ ජගත් ශාන්ත ජයලත් පෙරේරා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් සහ එකී කහවලගේ ජගත් ශාන්ත ජයලත් පෙරේරා මියගිය හෙයින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(3) වගන්තිය යටටතේ ලේකම්ආරච්චිලාගේ ශ්‍රියාලතා ඩිංගිරි මැණිකේ නැසීගිය කහවලගේ ජගත් ශාන්ත ජයලත් පෙරේරාගේ බුදලයේ නෛතික නියෝජිත වශයෙන් පත් කරනු ලැබූ ඇති හෙයින් ද,

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් තිස්එක් ලක්ෂ පනස් නවදහස් හයසිය හයයි ශත හැත්තෑ හත (රු. 3,159,606.77)ක මුදලක් 2005.12.31 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 3,159,606.77)ක මුදලට 2006.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වී නම් ඒ මුදල අඩුකොට එකී අංක 3410, 3664 සහ 3734 දරන උකස් බැඳුම්කරයන් මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනය් සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, උඩ පත්තුවේ, පැල්මඩුල්ලේ, පින්මුල්ලේ පිහිටි "පහලවත්ත හෙවත්එහාවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. ඩී. අමරසිංහ විසින් 1970ක් වූ දෙසැම්බර් මස 24 වැනි දින මැන සාදන ලද අංක 104 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : කිරිබබාට සහ තවත් අයට සහ යූ. ඉන්දිරා විසින් හිමිකම් කියන කිරිනාගයාය වත්තෙන් ද, නැගෙනහිරට : එස්. ඒ. පින්සේතුට හිමිකම් කියන තැන්නපිටිය වත්තෙන් ද, දකුණට : අඩි පාරෙන් ද, බස්නාහිරට : ඩිංගිරිඋක්කු හිමිකම් කියන පින්මුල්ලේ වත්තෙන් ද මායිම් වූ පර්චස් තිස් අටක් (අ. 0, රූ. 0, පර්. 38) විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැවිලි ආදි සියල් දේත් සමග වේ. මෙම ඉඩම රත්නපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/463/197 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති),
මණ්ඩලයේ ලේකම්.

06-816/1

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 09/0/33/00193.

ණයකරුගේ සම්පූර්ණ නම : සුදිරික්කු හැන්නදිගේ චමින්ද පුෂ්ප කුමාර.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩී. අමරසේකර විසින් ලියා සහතික කරන ලද අංක 19174 හා 1997.07.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූ දෙදහස් පන්සිය හැට හයයි ශත විසි හතර (රු. 92,566.24) ක මුදලක් වර්ෂ 2002.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස් නවදහස් දෙසිය හැට එකයි ශත දොළහ (රු. 59,261.12) ද වර්ෂ 2002.07.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස් තුන්දහස් තුන්සිය පහයි ශත දොළහ (රු. 33,305.12) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූ දෙදහස් පන්සිය හැට හයයි ශත විසි හතර (රු. 92,566.24) ද,

(2) එකී රුපියල් පනස් නවදහස් පන්සිය දෙසීය හැට එකයි ශත දොළහ (රු. 59,261.12) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ජී. පී. ආනන්ද යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය සභා සීමාවේ දෙනිපිටිය පිහිටි අඹගහවත්ත හා කුඹුර නමැති ඉඩමට වර්ෂ 1995.10.07 දින එස්. සමරසිංහ මානක තැන සකසන ලද අංක 144 පිඹුර ප්‍රකාර ලොට් 02ට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ඒ. එම්. සුගුණපාලගේ හා බී. එල්. විමලදාස හා අනෙක් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : බී. එල්. සුමනසේන හා ඒ. වී. සෝමදාසට අයිති ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් එකයි (අ. 0, රූ. 0, පර්. 31) වපසරියෙන් යුතු ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 816/262හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2002ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-781

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001382.

ණයකරුගේ සම්පූර්ණ නම : ඉයුමාල් රොෂාන් වීරපුර සහ රාජිකා දියුණි වීරමුණ්ඩ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. බුලත්වෙල විසින් ලියා සහතික කරන ලද අංක 677 හා 2003.10.04 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා

බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ දොලොස්දහස් පන්සිය දාහනවයයි ශත දහතුනක (රු. 8,12,519.13) ක මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ තිස්දෙදහස් හාරසිය පනස්හයයි ශත පනස්දෙකක (රු. 7,32,456.52) මුදල ද වර්ෂ 2006.01.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූදහස් හැටදෙකයි ශත හැටඑකක් (රු. 80,062.61) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අටලක්ෂ දොලොස්දහස් පන්සිය දහනවයයි ශත දහතුනක (රු. 8,12,519.13) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ තිස්දෙදහස් හාරසිය පනස්හයයි ශත පනස්දෙකක (රු. 7,32,456.52) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.90% බැගින් වන පොලියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ මීගමුව මහ නගර සභා සීමාවේ දළුපොත ග්‍රාමයෙහි පිහිටි කෝලා ඉන් කුඹුර නමැති ඉඩමට 2003.10.04 දින එන්. ඩී. ජී. සී. ගුණසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 2565/ඒ පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, උතුරට : ඩබ්. ජී. ක්‍රිස්ටි ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : සුමිතුරු මාවත ද, දකුණට : සීමාසහිත දළුපොත ස. ණ. ස. ඉඩම සහ ඩබ්. ජී. ක්‍රිස්ටි ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ඩබ්. ජී. වීරපුරගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිපහයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 25.60) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 898/53හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-782

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0300002084.

ණයකරුගේ සම්පූර්ණ නම : මොරදවත්තගේ උපුල් දේවරත්න.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. සිරිපාල විසින් ලියා සහතික කරන ලද අංක 1010 හා 2002.06.12 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දාහත්දහස් පන්සිය හැටහයයි ශත අනූදෙකක (රු. 2,17,566.92) ක මුදලක් වර්ෂ 2005.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූඅටදහස් හත්සිය හතයි ශත අසූහතක (රු. 1,88,707.87) මුදල ද වර්ෂ 2005.02.28 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඅටදහස් අටසිය පනස්නමයයි ශත පහක (රු. 28,859.05) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දාහත්දහස් පන්සිය හැටහයයි ශත අනූදෙකක (රු. 2,17,566.92) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඅටදහස් හත්සිය හතයි ශත අසූහතක (රු. 1,88,707.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොලියක් 2005.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ අප්‍රේල් මස 28 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, උතුරු කළුතර තොටමුණේ කළුතර බැද්ද හි පලාතොට ග්‍රාමයෙහි පිහිටි ගොඩපරගහහේනහි 1/7 කොටසක් නමැති ඉඩමට 2001.04.30 දින ජේ. කොඩිකාරගේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 2897 පිඹුර ප්‍රකාර ලොට් ඊඑෆ් 1ට මායිම්, උතුරට : පිඹුරු අංක 1649 හි දැක්වෙන ලොට් 02 ද, නැගෙනහිරට : ලොට් ඊඑෆ් 2 ද,

දකුණට : පිඹුරු අංක 813 හි දැක්වෙන ලොට් ජී ද (පාර) ද, බස්නාහිරට : පිඹුරු අංක 813 හි දැක්වෙන එම ඉඩමේම ලොට් ඩී ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 15.60) වපසරියෙන් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 144/253 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

06-780

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 09/0/00/00177.

ණයකරුගේ සම්පූර්ණ නම : රාජපක්ෂගේ පියදාස *නොහොත්* පියදාස රාජපක්ෂ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඊ. මුණසිංහ සහ එස්. ඒ. ආන්ද්‍රාහැන්නදි විසින් ලියා සහතික කරන ලද අංක 2378 සහ 3170 හා 1999.05.30 සහ 1998.02.11 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්අටදහස් අටසිය පනස්නවයයි ශත අටක (රු. 1,48,859.08) ක මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දසදහස් අටසිය අනූවයි ශත හැත්තෑඑකක (රු. 1,10,890.71) මුදලක් ද වර්ෂ 2003.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හත්දහස් නවසිය හැටඅටයි ශත තිස්හතක් (රු. 37,968.37) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්අටදහස් අටසිය පනස්නවයයි ශත අටක (රු. 1,48,859.08) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දසදහස් අටසිය අනූවයි ශත හැත්තෑඑකක (රු. 1,10,890.71) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොළියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ජී. පී. ආනන්ද යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, මිද්දෙනිය ග්‍රාමයෙහි පිහිටි අම්පිටියගේ වත්ත ලොට් 21 (ඊ. පී. 352792) නැමැති ඉඩමට 1990.02.08 දින එස්. කේ. පියදාස මානක තැන විසින් මැන සම්පාදිත අංක 1545 පිඹුර ප්‍රකාර ලොට් 21ඊ ට මායිම්, උතුරට : ලොට් 17 කොටසක්, ලොට් 18, 19, 20 ද නැගෙනහිරට : ලොට් 21එෆ් (අඩි 5 පළල පාර) ද, දකුණට : ලොට් 21කේ (අඩි 20 පළල පාර) ද, බස්නාහිරට : ලොට් 21ඩී ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 23.1) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, මාර්ග පරවශතාවය ද සමග තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 125/236 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2003 ක් වූ අප්‍රේල් මස 29 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

06-778

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 03/0/00/01918.

ණයකරුගේ සම්පූර්ණ නම : කිරඹ ආරච්චිගේ සෝමසිරි.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. බී. ඩී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 5097 හා 2001.03.12 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑහතරදහස් හයසිය හතලිස්දෙකයි ශත හැටක (රු. 74,642.60) ක මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටඑක්දහස් නවසිය හතලිස්පහයි ශත තිස්අටක (රු. 61,945.38) ද වර්ෂ 2003.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දොලොස්දහස් හයසිය අනූහතයි ශත විසිදෙකක් (රු. 12,697.22) ක්

ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑහතරදහස් හයසිය හතලිස්දෙකයි ශත හැටක (රු. 74,642.60) ද,

(2) එකී රුපියල් හැටඑක්දහස් නවසිය හතලිස්පහයි ශත තිස්අටක (රු. 61,945.38) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොළියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ, උතුරේ කළුතර බද්දේ පලාතොට ග්‍රාමයේ හි පිහිටි කිතුලාවකැලේ නමැති ඉඩමට 1999.11.02 දින එල්. ටී. ඒ. බාලචන්ද්‍ර මානක තැන විසින් මැන සම්පාදිත අංක 9906 පිඹුර ප්‍රකාර ලොට් 01 මායිම්, උතුරට පී. පී. ක. 475 පිඹුර ප්‍රකාර ලොට් 91 ද නැගෙනහිරට : පී. පී. ක. 475 පිඹුර ප්‍රකාර ලොට් 116 ද, දකුණට සහ බස්නාහිරට : අංක 9906 පිඹුරේ ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහලවක් (අ. 0, රු. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 20/118 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-779

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2004 ජූලි මස 08 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මයා විසින් සහතික කරන ලද 2002.12.11 දිනැති අංක 2516 දරන උකස්කරය මත මුල් මුදල් හා 2004.03.29 දින තෙක් පොලිය වශයෙන් රුපියල් පන්ලක්ෂ හයදහස් නවසිය පණහයි ශත අනූඅටක (රු. 5,06,950.98) මුදල සමග රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හාරසිය විසිදෙකයි ශත තිස් දෙකක (රු. 4,63,422.32) මුදල මත 2004.03.30 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් සියයට දහහතක (17%) පොලියක් ද, කුණ්ඩසාලේ, ගල්මඩුව වත්ත, අංක 59 දරන ස්ථානයේ පදිංචි ජෙසෙන්ද්‍ර ලියනගේ නිශාන්ති ද සිල්වා හෙවත් ජෙසෙන්ද්‍ර ලියනගේ නිශාන්ති රේණුකා ද සිල්වා මිය හා කිරිකංකානම්ගේ දීප්ත තිලංක ප්‍රනාන්දු මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මයා විසින් සහතික කරන ලද 2002.12.11 දිනැති අංක 2516 දරන උකස්කරය මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ හයදහස් නවසිය පනහයි ශත අනූ අටක (රු. 5,06,950.98) මුදල සමග 2004.03.30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරටය අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ නත්තරම්පොත හි පිහිටි බලයලත් මිනින්දෝරු තැන වන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ මයා විසින් සාදන ලද 1992.11.19 හා 1993.11.06 දිනයන්හි අංක 1569 දරන පිඹුරේ කැබලි 67 යනුවෙන් පෙන්නුම් කර ඇති ගල්මඩුව වත්ත යැයි හඳුන්වනු ලබන උතුර හා බස්නාහිරට : කැබලි 16 (පාර ප්‍රවේශය) ද, නැගෙනහිරට : කැබලි 68 ද, දකුණට : කැබලි 66 ද මායිම් වූ පර්චස් දහයයි දශම එකයි දෙකක (අ. 0, රූ. 0, පර්. 10.12) ප්‍රමාණයෙන් යුත් බෙදාවෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 619/188 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

06-792

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2005 මාර්තු මස 03 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් පී. එච්. ඉන්ද්‍රපාල ද සොයිසා මයා විසින් සහතික කරන ලද 1997.11.27 දිනැති අංක 481 දරන බැඳුම්කරය මත මුල් මුදල්

හා 2004.10.17 දින තෙක් පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ හැට නවදහස් හත්සිය පනස් හතක (රු. 5,69,757) මුදල සමඟ රුපියල් දෙලක්ෂ හැටදහස් හයසිය හැත්තෑ පහක (රු. 2,60,675) මුදල මත 2004.10.18 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් සියයට දහහතයි දශම පහක (17.5%) පොළියක් ද, මස්කෙළිය, සාමිමලේ පාර, අංක 130 දරන ස්ථානයේ පදිංචි මුකයියා පෝල් බාලචන්ද්‍රන් මහතා, මුතුකරුප්පන් කාමාච්චි මහත්මිය හා බාලචන්ද්‍රන් අන්තෝනි බාස්කරන් මහතා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 1997.11.27 දිනැති අංක 481 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ හැටනවදහස් හත්සිය පනස් හතක (රු. 5,69,757) මුදල සමඟ 2004.10.18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ, දැනට නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ, මස්කෙළිය ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරුතැන වන එල්. ඩී. මොල්ලිගොඩ මහතා විසින් සාදන ලද 1971 ජුනි මස 20 වැනි දිනැති අංක නු/මහ 528 දරන පිඹුරේ කැබලි 3 යනුවෙන් පෙන්නුම් කර ඇති ග්ලෙන්ටිල්ට් වතුයායේ කොටසක් වන උතුර-නැගෙනහිරට : එකී 528 දරන පිඹුරේ කැබලි 6 ද, දකුණු-නැගෙනහිරට : පාර ද, දකුණු-බස්නාහිරට : එකී 528 දරන පිඹුරේ කැබලි 4 ද, උතුරු-බස්නාහිරට එකී 528 දරන පිඹුරේ කැබලි 8 ද මායිම් වූ පර්චස් තුනයි දශම නවයයි එකක (අ. 0, රූ. 0, පර්. 3.91) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති ගොඩනැගිලි, වගාවන් හා සෑම සියළු දේ ද වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 28/176 වෙළුමේ හා පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ජී. වික්‍රමසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
මස්කෙළිය ශාඛාව.

06-791

---

එන්(පීවීඑස්) 28678.

### 1982 අංක 17 දරන සමාගම් පනත

#### 373(3) වගන්තිය යටතේ ඒ. බී. සී. ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2001.06.25 දින සංස්ථාපිත සමාගමක් වන ඒ. බී. සී. ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඒ. බී. සී. ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 මැයි මස 31 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

06-700

---

එන්(පීවීඑස්) 18479.

### 1982 අංක 17 දරන සමාගම් පනත

#### 373(3) වගන්තිය යටතේ මොබිල් ඔයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1997.01.29 දින සංස්ථාපිත සමාගමක් වන මොබිල් ඔයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, මොබිල් ඔයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 මැයි මස 31 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

06-699

---

එන්(පීවීඑස්) 23420.

### 1982 අංක 17 දරන සමාගම් පනත

#### 373(3) වගන්තිය යටතේ බීටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.03.30 දින සංස්ථාපිත සමාගමක් වන බීටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, බීටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන

සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 මැයි මස 31 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

06-701

---

එන්(පීවීඑස්) 26506.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ එලෝහිම් ලොජිස්ටික්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2000.07.17 දින සංස්ථාපිත සමාගමක් වන එලෝහිම් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එලෝහිම් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 මැයි මස 31 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

06-702

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේ4/4782/කේවයි3/598.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. නාවලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් පී. ජේ. රත්නායක විසින් සහතික කරන ලද 2001.06.14 දින හා අංක 1671 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම නාවලපිටිය පදිංචි ජයගෞරි වේලායුදම් හෙවත් පොන්නයියා ජයගෞරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැටනවදහස් අනූ එකයි ශත එකක (රු.269,091.01) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1671 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත හැත්තෑ හය (රු.85.76) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල, අංක 26බී බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය නගර සභා සීමාවේ, සොයිසා කැලේ ග්‍රාමයේ, වරිපනම් අංක 35/එල් දරන සොයිසා කැලේ පාරේ පිහිටි සොයිසා කැලේ *හෙවත්* කැටවල නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. ෂෙරිෆ් විසින් 1992.03.12 දින සාදන ලද හා අංක 4472/92 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 3 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 7.33 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද එකී අංක 4472/92 මිණුම් පිඹුරේ කැබලි අංක 15 සහ 16 මතින් ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03,

06-796/15

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/2173/කේ2/947.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් සී. ගුණතිලක විසින් සහතික කරන ලද 2004.06.01 දින හා අංක 4322 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම වැලිවේරිය පදිංචි පනන්වල ගෙදර සරත්චන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ තුන් දහස් තුන්සිය අසූපහයි ශත අසූහයක (රු.203,385.86) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 4322 ප්‍රකාර

ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැට හතරයි ශත හතලිස් තුන (රු.64.43) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරස්‍රය, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගල්ඔලුව ග්‍රාමයේ, දුනුගල්පිටිලන්ද නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එල්. ඩී. සිල්වා විසින් 2003.07.27 දින සකසන ලද අංක 1463 දරන මිනුම් පිඹුරේ කැබැලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තව ද එකී පිඹුරේ සඳහන් කැබැලි අංක 2 මතින් දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-796/14

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/45576/එෆ්6/195.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හොරණ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. සුමනසිරි විසින් සහතික කරන ලද 2003.07.24 දින හා අංක 2058 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හෝමාගම පදිංචි වීරසිංහගේ පියදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.19 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් හත්දහස් එකසිය හැත්තෑ පහයි ශත පනස් හතරක (රු.247,175.54) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2058 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ හතයි ශත හැත්තෑතුන (රු.87.73) බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය සභා බල සීමාවේ පල්ලන්මාරුව සහ ඔලබොඩුව පිහිටි ඔලබොඩුව වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. සෝමසිරි විසින් මැන සකසන ලද (1999.11.10) ඔප්පුවේ ප්‍රකාර 1999.09.04 සහ 1999.09.27 දින හා අංක 773 දරන පිඹුරේ කැබලි අංක 11 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15.02 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තව ද එකී පිඹුරු අංක 773 හි කැබලි අංක 132, 131 ඒ, 131බී, 133 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-796/16

---

එන් (පීවීඑස්) 40521.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ සුගී එක්ස්පෝර්ට්ස් ඇන්ඩ් ඉම්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.02.11 දින සංස්ථාපිත සමාගමක් වන සුගී එක්ස්පෝර්ට්ස් ඇන්ඩ් ඉම්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත්වූ විට සුගී එක්ස්පෝර්ට්ස් ඇන්ඩ් ඉම්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 මැයි මස 31 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

06-703

## සීමාසහිත සෙලාන් බැංකුව-මහරගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0040-125077-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.16 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ස්වාමිනාදන් විසින් සහතික කරන ලද 2002.04.01 දිනැති අංක 5276 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, සියල්ලෝම මහරගම පදිංචි කත්‍රිආරච්චිගේ චන්ද්‍රා අබේරත්න, දොන් වොට්සන් වෙඩිකා අබේරත්න සහ යමුනා රංග සුභාෂිනී මුණසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අනූ තුන්දහස් හත්සිය තිස් නවයයි ශත හතලිස් හතරක (රු. 2,93,739.44) මුදලක්, 2004 අගෝස්තු මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 2,93,739.44 මුදල ද, 2004 සැප්තැම්බර් මස 01 දින විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 5276 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ වැල්මිල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2000.02.03 දිනැති අංක 2759 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එගොඩහේනවත්ත *හෙවත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 03 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : කැබලි අංක 1 සහ 2 ද, නැගෙනහිරට: කැබලි අංක 4 ද, දකුණට : කැබලි අංක 14 සහ බස්නාහිරට : කැබලි අංක 11 ද යන මායිම් තුළ එකී අංක 2759 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.25) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව සී 198/51හි ලියාපදිංචි කර ඇත.

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-744/1

## සීමාසහිත සෙලාන් බැංකුව-ඇඹිලිපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0450-4503220-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.07 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝති විසින් සහතික කරන ලද 2002.05.03 දිනැති අංක 793 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ඇඹිලිපිටිය පදිංචි වතුසුද්දගේ රෝයි සිල්වෙස්ටර් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හතලිස්අටදහස් පන්සිය පනහයි ශත තිස්හතරක (රු. 5,48,550.34) මුදලක්, 2005 මාර්තු මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,48,550.34 මුදල ද, 2005 අප්‍රේල් මස 01 දින විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 793 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, කුළුගම්මන සිය පත්තුව කොන්ඩදෙනිය පිහිටි ආර්. සී. ඕ. ද ලා මොට්ටේ විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 19 දිනැති අංක 3195/එක්ස් දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මලුමුර පංගුව හේන නමැති ඉඩමේ කොටසක් වන කැබලි අංක 1ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම ඊසානට : එකී සැලැස්මේ 1බී කොටස ද, නැගෙනහිරට: අංක 3995/සී දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මලුමුරපංගුවේ කොටසක් ද, දකුණට : අංක 3195/එක්ස් දරන එකී සැලැස්මේ කැබැලි අංක 2 ද සහ බස්නාහිරට : හොරතලේ හපුගහමුලහේන ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල එකී සැලැස්මේ දැක්වෙන පරිදි පවත්නා මාර්ග අයිතිය සහ පාරේ සිට ප්‍රවේශ මාර්ගය සහ පයිප්ප, දුරකථන සහ විදුලි කේබල් දැමීමේ අයිතිය සහ වෙනත් සියලු අයිතීන් සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-744/3

## සීමාසහිත සෙලාන් බැංකුව - හම්බන්තොට ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 09360880.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.05.23 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ප්‍රසිද්ධ නොතාරිස් ඩී. රංගේ විසින් සහතික කරන ලද 2003.08.08 දිනැති අංක 429 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට, මහ විදිය, අංක 121හි දික්වැල්ල කෙමිකල්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන වත්තුහේවගේ විජේසිරි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පහළොස්ලක්ෂ විසිදහස් දෙසිය අනූපහයි ශත හැට දෙකක (රු. 25,20,295.62) මුදලක්, 2006 ජනවාරි මස 04 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 25,20,295.62 මුදල ද, 2006 ජනවාරි මස 05 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 429 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ වලව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසූරිය විසින් සාදන ලද 1964.02.15 දිනැති අංක 182 දරන සැලැස්මේ සඳහන් රොඩ්මුල්ල සී කැබැල්ල නමැති ඉඩමේ කැබලි අංක සී19 ලකුණු කළ ඉඩම් කොටසට මායිම් උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ සී18 කැබැල්ල ද, දකුණට : ප්‍රධාන පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ සී20 කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් විසි අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.25) විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී46/81හි ලියාපදිංචි කර ඇත.

මැතක මැනීමකදී එකී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

පෙර කී වලව පිහිටි රොඩ්මුල්ල සී කැබැල්ල නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද 2002.09.07 දිනැති අංක 3509 දරන සැලැස්මේ සඳහන් සී19 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : අංක 182 දරන සැලැස්මේ සඳහන් සී18 කැබැල්ල ද, දකුණට : වෙන්කළ ඉඩම සහ බස්නාහිරට: අංක 182 දරන සැලැස්මේ සඳහන් සී20 කැබැල්ල යන මායිම් තුළ පර්චස් විසි අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.25) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-744/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 15900003141.

ණය ගිණුම් අංකය : 132265.

2005 මැයි මස 31 වැනි දින පත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. එල්. වික්‍රමාරච්චි විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද, 2002 මැයි මස 31 වැනි දින හා අංක 5950 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලක්ෂපති මහවිදානලාගේ ප්‍රින්ස් ලොයිඩ් ඇන්ටියස් ද මෙල් හෙවත් ලක්ෂපති මහවිදානලාගේ ප්‍රින්ස් ලොයිඩ් ඇන්ටොස් ද මෙල් සහ ලිහිණියා කුමාරගේ සරෝජා පුෂ්පකුමාරි ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහඅට ලක්ෂ පනස්එක් දහස් දෙසිය තිහයි ශත හැත්තෑතුනක (රු. 18,51,230.73) මුදලක් 2005 පෙබරවාරි මස 28 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහඅට ලක්ෂ පනස්එක් දහස් දෙසිය තිහයි ශත හැත්තෑ තුනක (රු. 18,51,230.73) මුදලට 2005 මාර්තු මස 01 වැනි දින සිට සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,96,297ක මුදල මත 19%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලක් අඩුකොට එකී අංක 5950 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩ්‍රොප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කෝමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක එල්. එන්. fපර්නන්ඩු විසින් 2001 නොවැම්බර් මස 24 වැනි දින සාදන ලද අංක 3446 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු සල්පිටි කෝරළේ, මොරටුව මහ නගර සභා සීමාව

තුළ වරිපනම් අංක 37/2 දරන ගොඩනැගිලි සහ එහි තුළ පිහිටි සියළුදේත් සමඟ බෙදා වෙන් කරන ලද කඩුපිටියෙවත්ත, කටුගස්තුඩුව, ගොරකගහලන්ද *හෙවත්* ගොරකගහකනත්ත සහ කඩුපිටියේබැඩව්වැට ඉඩමේ ලොට් ඒ දරන කොටසට මායිම් උතුරට : හිරාන් පර්නැන්ඩු විසින් සාදන ලද අංක 311 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : අංක 311 දරන පිඹුරේ පෙන්වා ඇති අඩි 10ක් පළල පාරක් සඳහා වූ ලොට් 4 ද, දකුණට : අඩි 12ක් පළල පාර ද සහ බස්නාහිරට : සී. එස්. පෙරේරා මහත්මියට හිමි දේපළ ද යන මායිම් තුළ අංක 3446 දරන පිඹුර පරිදි පර්චස් දාහතරයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 14.6) විශාල ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2608/188 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

පහත සඳහන් කොටස් ඔස්සේ ගමන් කිරීමේ අයිතිය ද සමඟ වේ :

බලයලත් මානක එල්. එන්. fපර්නැන්ඩු විසින් 1988 ජූලි මස 02 වැනි දින සාදන ලද අංක 311 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු සල්පිටි කෝරළේ, මොරටුමුල්ල ග්‍රාමයේ ඉදිබැද්ද පාරේ පිහිටි කඩුපිටියෙවත්ත, කටුගස්තුඩුව ගොරකගහලන්ද *හෙවත්* ගොරකගහකනත්ත ඉඩමේ (පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන කොටසට මායිම් උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 2 සහ එම ඉඩමේ කොටසක් වන ඩැනිස්ටර් මෙන්ඩිස්ගේ ඉඩම ද, දකුණට : පාර ද සහ බස්නාහිරට : පාර ද, සී. එස්. පෙරේරා මහත්මියට හිමි එම ඉඩමේ කොටසක් ද සහ ලොට් 1 සහ 3 ද යන මායිම් තුළ අංක 311 දරන පිඹුර පරිදි පර්චස් හයයි දශම දෙකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 6.24) විශාල ඉඩම් කොටස ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1708/125 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

බලයලත් මානක ඩී. ඩබ්. අබේසිංහ විසින් 1986 මාර්තු මස 31 වැනි දින සාදන ලද අංක 2089 දරන පිඹුර පරිදි එකී මොරටුමුල්ල ග්‍රාමයේ ඉදිබැද්ද පාරට නුදුරින් පිහිටි කඩුපිටියෙවත්ත, කටුගස්තුඩුව, ගොරකගහලන්ද *හෙවත්* ගොරකගහකනත්ත ඉඩමේ (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන්කොට) බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන කොටසට මායිම් උතුරට ලොට් 2 ද, නැගෙනහිරට ලොට් 1 ද, දකුණට එල්. ඒ. fපර්නැන්ඩුගේ උරුමක්කාරයින්ට හිමි දේපළ ද සහ බස්නාහිරට පාර ද යන මායිම් තුළ අංක 2089 දරන පිඹුර පරිදි පර්චස් හතරයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 4.50) විශාල ඉඩම් කොටස ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1708/126 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-799

---

## පී. ඒ. බී. සී. බැංකුව-පංචිකාවත්ත ශාඛාව

### පී. ඒ. බී. සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 මාර්තු 29 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලදී. :

පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් කලින් හඳුන්වනු ලැබූ දැනට සීමාසහිත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් ලියා සහතික කරන ලද අංක 1362 හා 2004 ජූලි මස 16 වැනි දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කුරේ මෝටර් වර්ක්ස් හි තනි අයිතිකරු වශයෙන් බුලත් සිංහලගේ ධර්මරත්න කුරේ විසින් පැහැර හැර ඇති හෙයින් ද, වසර දෙදහස් හයේ (2006) ජනවාරි 31 දිනට ඉහත කී අංක 1362 උකස් බැඳුම්කරය මත පී. ඒ. බී. සී. බැංකුවට රුපියල් අටලක්ෂ එකලොස් දහස් හයසිය දාහතරයි ශත අසූහයක (රු. 811,614.86) මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ එකොලොස්දහස් හයසිය දාහතරයි ශත අසූහයක (රු. 811,614.86) මුදල දෙදහස් හයේ (2006) පෙබරවාරි පළමුවැනි දින සිට විකිණීමේ දිනය දක්වා ශේෂයකට 31% බැගින් ගණන් බලන ලද පොළිය ද සමඟ සහ ලැබී ඇති ගෙවීම් වේ නම් එය අඩුකොට ප්‍රචාරක හා විකුණුම් වියදම් ද සියළු වියදම් මුදල් ද සහ සීමාසහිත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් විසින් දරන්නට යෙදුනු සියලු ගාස්තු සහ පිරිවැය ද සමඟ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව සහ එකී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති අනුව අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1362 දරන උකස් බැඳුම්කරය මගින් පී. ඒ. බී. සී. බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ මනාව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ පී. ඒ. බී. සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පහළ බෝමිරියෙහි පිහිටි වල්කඩයාවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ජී. කම්මානන්කඩ විසින් මැන සාදන ලද අංක 820 සහ 1989.03.21 දින දරන පිඹුරේ ලොට් 1ඒ දරන බෙදා වෙන් කරන ලද බිම් කට්ටියට මායිම් උතුරට : ඩී. ඩී. සෝමාවතීගේ ඉඩම ද, නැගෙනහිරට : කරගහහේන පාර සහ මෙහි ලොට් 1බී ද, දකුණට : මෙහි ලොට් 1බී සහ ලොට් 1සී ද සහ බස්නාහිරට : කරල්ගහහේන ඉඩම ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස්නවයයි දශම දෙකක (අ. 0. රූ. 1, පර්. 39.2) ඉඩම.

මැනකදී සිදුකරන ලද මැනුමකට අනුව ලොට් 1ඒ පහත පරිදි විස්තර වේ :

ඉහතින් සඳහන් කළ පහළ බෝමිරියෙහි වල්කඩයාවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ජී. කම්මානන්කඩ විසින් මැන සාදන ලද අංක 820ඒ සහ 2004.06.22 දින දරන පිඹුරේ ලොට් 1ඒ දරන බෙදා වෙන් කරන ලද බිම් කට්ටියට මායිම් උතුරට ඩී. ඩී. සෝමවතීගේ ඉඩම ද, නැගෙනහිරට ප්‍රාදේශීය සභා පාර සහ ලොට් 1බී ද, දකුණට ලොට් 1බී ද, බටහිරට බී. එස්. කුරේගේ කරගහහේන ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම දෙකක (අ. 0, රූ. 1, පර්. 39.2) ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. වරුණි එගොඩගේ,
කළමණාකරු-නීති.

06-797